**2009 නොවැම්බර් මස 17 වන දින පවත්වන ලද සංස්ථාපිත නීති අධ්‍යාපන සභාවේ උසස් නීති අධ්‍යයන ආයතනයේ උපාධි ප්‍රදානෝත්සවයේදී අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු මිලින්ද මොරගොඩ මැතිතුමා විසින් පවත්වන ලද උපාධි ප්‍රදානය කිරීමේ කථාව**

**ගැටුම්වලින් පසු ශ්‍රී ලංකාව- එදිරිවාදි සමාජයක සිට සානුකම්පික සමාජයක් වෙත යන ගමන**

ගරු අග්‍රවිනිශ්චයකාර අශෝක ද සිල්වා මැතිතුමනි, සම්භාවනීය අමුත්තනි, නෝනාවරුනි, මහත්වරුනි, සංස්ථාපිත නීති අධ්‍යාපන සභාවේ උසස් නීති අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ යසන්ත කෝදාගොඩ මහතාත්, සහකාර අධ්‍යක්ෂ අයේෂා ජිනසේන මහත්මියත් විසින් ශ්‍රී ලංකාවේ නීති අධ්‍යයනය සඳහා ලබාදී ඇති නායකත්වය සම්බන්ධයෙන් ඔවුන්ට මාගේ ප්‍රශංසාව ප්‍රකාශ කරනු කැමැත්තෙමි. අද උපාධි සහ ඩිප්ලෝමා ලබන ඔබ හැම දෙනාටමත් සුබ පැතීමට කැමැත්තෙමි. නිදහසෙන් පසුව අපගේ ඉතිහාසයේ වැදගත්වූත් තීරණාත්මකවූත් අදියරකට අප පා තබන අවස්ථාවේදී, මෙම ආයතනයේ විවිධ වැඩ සටහන්වලට සහභාගිවීමෙන් ඔබ ලබාගෙන ඇති දැනුම, අද උද්ගතවී ඇති අභියෝග රාශියකට මුහුණ පෑමට ඔබට උපකාරී වනු ඇත.

නීතිය සහ දේශපාලනය යන අංශ දෙකටම පොදුවූ එක් දෙයක් ඇත, එනම් ජනතාවයි. හිතකර නීති මගින් දේශපාලකයන් විසින් ව්‍යවස්ථා සම්පාදකයන් වශයෙන්, ජනතාවට ජීවත්වීමට, වැඩ කිරීමට සහ සෞභාග්‍යයට පත්වීමට සාධාරණ සමාජයක් සඳහා අවශ්‍ය රාමුවක් නිර්මාණය කරන අතර, නීතිඥයෝ සාධාරණත්වය සහ යුක්තිය ඇති වන පරිදි නීතිය අදාළ කර ගනිමින් අර්ථ නිරූපණය ද කරති. මෙබඳු අවස්ථාගත කරුණු යටතේ, නීති සහ අධිකරණ ක්‍රමය කෙරෙහි විශ්වාසයක් පුරවැසියන් තුළ ගොඩනැගේ. ජනතාව කළයුත්තේ නීතියට බියවීම නොව නීතියට ගරු කිරීමය.

ප්‍රජාතන්ත්‍රවාදය මැනවින් ක්‍රියාත්මක වන රටක මෙම ක්‍රියාවලිය හොඳින් ක්‍රියාත්මක වන අතර, ඵලදායී තුලනයක් සාක්ෂාත් කරගනු ලැබේ. නීති පද්ධතිය පවු දේශපාලනයෙන් ස්වාධීනව පක්ෂපාතිත්වයෙන් තොරව ක්‍රියාත්මක වේ. දේශපාලකයෝ ව්‍යවස්ථා

සම්පාදකයන් වශයෙන් රටට සහමතිය අවශ්‍ය වන අවස්ථාවලදී එක් මතයක පිහිටීමෙන් සහ තවත් විටෙක, එකිනෙකට වෙනස් වන ප්‍රමුඛත්ව හෝ ජනතාව මුහුණපාන ගැටළුවලට දියයුතු විසඳුම් පිළිබඳ දේශපාලන දර්ශනය නිසා විවිධ මත දරමින් ප්‍රබල විවාද මගින් යහපත් නීති සම්පාදනය කරති. මෙය වූකලී අද ලෝකය පුරා පැතිර පවත්නා ප්‍රජාතාන්ත්‍රික රටවල් විශාල සංඛ්‍යාවක දක්නට ලැබෙන පරිදි එදිරිවාදී දේශපාලනයේ පදනමයි.

ඉන්දියාව, ජපානය, එක්සත් ජනපදය, එක්සත් රාජධානිය සහ ඕස්ට්‍රේලියාව වැනි බොහෝ ප්‍රජාතාන්ත්‍රික රටවල්වල බොහෝ විට, දෘෂ්ටි හෝ දර්ශන දෙකක් නියෝජනය කෙරෙන ප්‍රතිවිරුද්ධ ප්‍රධාන පක්ෂ දෙකක් හෝ සන්ධාන දෙකක් තිබේ. නවීන යුගවලදී, පාර්ශ්ව දෙක අතරේ පවත්නා වෙනස්කම් ඉතා ලිහිල් බවට පත්වී ඇති අතර, ඇතැම් විට සත්‍යවූත් මූලිකවූත් වෙනස්කම්වලින් තොරවූ භේදයක් පමණක් ඇති බවක් පෙනෙන්නට තිබේ. එම පක්ෂ තම ප්‍රතිපත්ති සකස් කරන අතර, තම අදහස් ප්‍රවර්ධනය කරති. ඔවුන් විවාදයට එළඹ සිටින අතර, ඔවුන්ගේ අදහස් සහ ප්‍රතිපත්ති, එකී එදිරිවාදී අභියෝගවල තිව්‍ර බවෙන් පරීක්ෂණයට භාජනය කෙරේ. නමුත් හැම අවස්තාවකදීම, අදහස් සඳහා සහ ඒවා ප්‍රකාශ කරන තැනැත්තාට ගෞරවයක් දැක්විය යුතුයයි අපේක්ෂා කෙරේ. මෙම එදිරිවාදී වූ, නමුත් විවාදය සඳහා වූ ගෞරවණීය ප්‍රවේශය මගින්, ක්‍රියාත්මක කළහැකි දෙය ක්‍රියාත්මක කළ නොහැකි දෙයින් වෙන්කර ගැනීමෙන් සහ සමාජයට අදාළ වන සහ වාසිදායක නීති ඇති කරමින් වැඩිවැඩියෙන් අදහස් ප්‍රකාශ කිරීම උනන්දු කරවනු ලැබේ.

මෙම එදිරිවාදී ක්‍රියාවලියේ අරමුණ වනුයේ, ජනතාවට සාමයෙන් ජීවත්වෙමින් සෞභාග්‍යය කරා ලඟාවිය හැකි සමාජයක් සඳහා වූ ගතිකවූත්, අනුවර්තනීයවූත් සහ සජීවීවූත් රාමුවක් ගොඩනැඟීමය. සමාජය වෙනස්වන නිසාත්, සකස් කරනු ලබන නීති පද්ධතිය, එකී රාමුව වඩාත් යහපත් බවට පත්වන පරිදි එකක් මත එකක් වශයෙන් ගොඩනැඟෙන නිසාත් එය අඛණ්ඩ ක්‍රියාලියක්වේ.

මැතිවරණයක් පැවැත්වෙන අවස්ථාවලදී එදිරිවාදී දේශපාලනය වඩාත් තිව්‍ර වේ. මාධ්‍යවල පූර්ණ අවධානය දේශපාලන සටන කෙරෙහි එල්ලවීමත් සමගම, දේශපාලකයෝ, ජනතාවගේ විනිශ්චය සඳහා තම ප්‍රතිපත්ති ජනතාව වෙත ඉදිරිපත්

කරති. එක්තරා අවස්ථාවක ලී ක්වාන්යූ විසින් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය විස්තර කළ පරිදි, මෙය ඉටුකළ යුත්තේ නොපවත්නා සම්පත් වරින්වර වෙන්දේසි කිරීමක් ලෙස නොව ජාතියක අනාගතය හැඩගස්වන විවාදයක් ලෙසටය.

ඇත්ත වශයෙන් කියනවානම් මැතිවරණ ව්‍යාපාරවලදී අතිශයෝක්තිය සහ හරය අතරේ සියුම් තුලනයක් ඇති කළ යුතුය. නරක පුරුදුවලට ඇබ්බැහිවීම පහසුය. ඔබගේ ප්‍රතිපත්ති, අදහස් අතින් බංකොළොත් වූ විට, අනෙක් පාර්ශ්වයට පහරදීමත්, එම පාර්ශ්වය ඉදිරිපත් කරන දෙය සමච්චලයට පාත්‍ර කිරීමත්, මැතිවරණය පෞද්ගලික කර ගැනීමත් පහසුය. මෙය හැම ප්‍රජාතන්ත්‍රවාදී රටකම කලින් කලට සිදුවන තත්වයකි. මෙය සිදුවන අවස්ථාවේදී මාධ්‍යයේ කාර්යභාරය වනුයේ, අතිශයෝක්තිය අනාවරණය කොට, හරය සංවාදයේ පෙරමුණට නැවත පත්කොට දේශපාලන අන්තවාදය සීමාකර තැබීමය.

ප්‍රජාතන්ත්‍රවාදයක පැවැත්ම රඳා පවතින නිර්මාණාත්මක තුලනය නියම වශයෙන්ම ක්‍රියාත්මක විය යුත්තේ මේ ආකාරටය. එසේ වන විට ප්‍රජාතන්ත්‍රවාදය වැජඹේ. එය වැරදුන විට, අසමතුලිත බවක් ඇතිවන අතර, එමඟින් ප්‍රජාතන්ත්‍රවාදය මැලවී යයි. ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ ස්ථාවරත්වයක් ඇති කරන මෙම තුලනය ලඟාකර ගැනීම සඳහා දේශපාලකයන් ද නීතිඥයන් ද, මාධ්‍යයද ඒ සමගම සිවිල් සමාජය ද යන සියලුම අය විසින් තම තමන්ගේ කාර්ය භාරය ඉටුකළ යුතුය. අද ශ්‍රී ලංකාවෙහි, අවුරුදු තිහක් පැවති ගැටුම් සහ ප්‍රචණ්ඩත්වය අවසන්වීමෙන් අනතුරුව, අප රටේ පවත්නා ප්‍රජාතන්ත්‍රවාදය සහ එහි ක්‍රියාකාරීන් විසින් ඉටු කරන කාර්ය භාරයද මැන බැලිය යුතුය.

මගේ තර්කය නම්, මෙම ගැටුමේ පරිහානිකර බලපෑම මෙම ආයතන බොහොමයක් විනාශකර ඇති බව සහ අපගේ පුරුෂාර්ථයන් අහිතකර බලපෑමට යටත්කර, අපගේ සමාජය කොටස්වලට කඩාබිඳ දමා ඇති බවය. ඉතා යහපත් සමබරතාවයකින් යුත් සහ හොඳින් ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදයක් වෙනුවට අද අපට ඇත්තේ, වෛරය, ඊර්ෂ්‍යාව, තන්හාව සහ ආත්මාර්ථකාමීත්වය පොදු ලක්ෂණය වන තරඟකාරී සමාජයකි. අපගේ සමාජයේ මෙම පරිවර්තනය වැඩ වැඩියෙන් ද අදෘශ්‍යමානවද සිදුවී තිබේ. ජනතාවද පක්ෂද එකට එක්වී වඩා හොඳ අනාගතයක් සඳහා කටයුතු කිරීමේ අසීමිත අවස්ථාවන්ද

හැම හේතුවක්ම ද තිබෙන ගැටුමෙන් පසු එළඹ ඇති මෙම කාලය තුළදී, අප හැම දෙනාම සාමූහිකව අත් විඳින ලද ක්ෂතියේ ඉතිරි බලපෑමෙන් තෘප්තිමත්ව සිටින බවක් පෙනෙන්නට තිබේ.

අප සියලුදෙනාම එම චෝදනාව සමානව භාරගත යුතුය. ගෙවීගිය වසර ගණනාව පුරාවම අප සමාජය වෛරයේ ගිනිදැල් වලින් මුදවා ගැනීමට සහ ජාතිය, ආගම, කුලය, පංතිය සහ දේශපාලනික වශයෙන් බෙදීමට ලක්වීම නතර කිරීමට අපි අපොහොසත් වීමු. අපගේම නොසැලකිල්ල නිසා මෙම වෛරය වැඩිදියුණුවීමට අප විසින් තෝරාගෙන ඇත.

මෙම අවසන් අවස්ථාවේදී වුවද, අප විසින් අප කෙරෙහි දැඩි අවධානයක් යොමුකර අපගේ ක්‍රියාමාර්ගයන් නිවැරදි කර නොගතහොත් අපගේ සොල්දාදුවන් සහ ජනතාව ත්‍රස්තවාදය පරාජය කර මෙම නව යුගය උදාකිරීම සඳහා සිදුකළ පරිත්‍යාගයන් බරපතල අවදානමකට ලක්වනු ඇත.

නිදසුනක් වශයෙන් සාමාන්‍ය මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයක් ගෙන බලමු. එය උසස් පරමාදර්ශයන්, මනාව සංවර්ධනය වූ ප්‍රතිපත්තීන් සහ වඩා යහපත් අනාගත ජාතියක් සඳහා වන දැක්මක් ඇතුළත් ලියවිල්ලක් වන්නේ ද? එසේ නැත්නම් එය එක්තැනක ඡන්දයක් මිලදීගැනීම සඳහා වන සහ තවත් තැනක ඡන්දදායකයන් තමන් වෙතට ආකර්ෂණය කරගැනීම සඳහා සැලසුම් කරන ලද තෑගි එකතුවක් ද?

අපගේ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයන් කෙබඳුද? ඒවා අප ඉදිරියට ගමන් කළයුතු හොඳම මාර්ගය පිළිබඳව වන බරපතල විවාදයන් ද? නැතිනම් ඒවා කථිකයන් විසින් තම දේශපාලන ප්‍රතිවාදීන් සෝෂාකාරී ලෙස විවේචනය කරනු ලබන ඔවුන් සම්ච්චලයට සහ අපහාසයට ලක්කරනු ලබන රැස්වීම් මාලාවක් ද? ඔබලාගෙන් කීදෙනෙකු තම දරුවන් දේශපාලන රැස්වීම්වලට සහභාගිවීම හෝ එම කාරණය සම්බන්ධයෙන් අපගේ පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගිවීම පිළිබඳව ප්‍රසන්න හැඟීමක් දරන්නේ ද?

අපගේ මාධ්‍ය භාවිතය කෙබඳුද? දේශපාලනමය සහ ප්‍රතිපත්තිමය ගැටළු පිළිබඳව ආවේගයෙන් තොර විශ්ලේෂණයක් ඇතුළත් පිටුවලින් සහ කාලීන සිදුවීම් පිළිබඳ වැඩ සටහන්වලින් ඒවා පිරී පවතී ද? යම් ගැටළුවක සියලුම පැති ඔවුන් විසින් ඉදිරිපත් කිරීමට ඔවුන් අපේක්ෂා කරන්නේ ද? ඔවුන් ආන්දෝලනාත්මක කරුණු කෙරෙහි පමණක් අවධානය යොමු කරන්නේද නැතහොත් නිර්මාණශීලි ලෙස කටයුතු කිරීමට ඔවුන් අපේක්ෂා කරන්නේ ද? වැදගත් දේශපාලන විවාදයට වඩා ඔවුන් අවධානය යොමු කරන්නේ පුද්ගල අපවාදයට සහ චරිත ඝාතනයට ද?

සිවිල් සමාජය කෙබඳුද? අප සමාජයේ සිටින දුප්පත්ම අයට මුහුණදීමට සිදුවී ඇති ගැටළු පිළිබඳව මෙන්ම අපගේ අධ්‍යාපනය, සෞඛ්‍ය ආරක්ෂණ පද්ධතිය සහ යටිතල පහසුකම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කළ හැකි බව තහවුරු කිරීම පිණිස අප විසින් එක්ව ගතයුතු අසීරු ආර්ථික ක්‍රියාමාර්ගය පිළිබඳව සිදු කරනු ලබන තර්කානුකූල සාකච්ඡාවන්ට වඩා දේශපාලන ප්‍රෝඩාවන්ට මෙම හඬවල් කොපමණ අවස්ථාවන්හිදී යටපත් වී ඇද්ද? දේශපාලනඥයන් වශයෙන් දුගී දුප්පත් ජනතාව දරිද්‍රතාවයෙන් මුදවාගනු ලබන ප්‍රතිපත්ති සඳහා අප සහාය දක්වන්නේ ද? නැතහොත් කෙටිකාලීන සහනයක් පිළිබඳ පොරොන්දු මඟින් ඔවුන්ගේ ඡන්දය මිලදී ගන්නේ ද?

එලෙසම අපගේ නීති පද්ධතිය කෙබඳු එකක්ද? සියලුම පුරවැසියන් සඳහා කාලය සාධාරණත්වයක් ලබාදෙන අපක්ෂපාතී සහ සාධාරණ නීති පද්ධතියක් අප සතුව පවතින බව මෙහි සිටින සියලුම දෙනා විශ්වාස කරන්නේ ද? නැත. අවුරුදු තිහක යුද්ධයකින් පසුව ද්වේශ සහගත සිතිවිලිවලින් පසුවන අප සමාජය යහපත් සියලුදේ විකෘති කරනු ලැබ ඇති සහ සංවර්ධනය වන ප්‍රජාතන්ත්‍රවාදයක නිර්මාණශීලි සමබරතාව උඩියටිකුරු කර ඇති බව මම කණගාටුවෙන් යුතුව ප්‍රකාශ කළ යුතුය. දේශපාලනඥයන් නීතිඥයන්, මාධ්‍ය සහ සිවිල් සමාජයේ තීරණාත්මක සහ ස්ථිර ප්‍රයත්නයකින් තොරව වෙනස් කිරීමට අසීරු සමාජය තුළ මුල්බැසගත් යටි අදහසකට සහ කෙටිකාලීන චින්තනයට එම තත්ත්වය දායක වී ඇත.

වසර අනූවකට පෙර, මේ හා සමාන අභියෝගකාරී එහෙත් වෙනස් ගැටළුවලට මුහුණදීමට අපගේ රටට සිදුවිය. අපගේ රට අධිරාජ්‍යවාදී පාලනය යටතේ පැවති යුගයේදී

සියලුම ජන කොටස්වලට අයත් අපගේ ඇතැම් ශ්‍රේෂ්ඨ චින්තකයෝ සහ නායකයෝ සමාජ සහ දේශපාලන ප්‍රතිසංස්කරණයන් සහ නිදහස උදෙසා එක්ව කටයුතු කලහ. ඔවුන්ට උසස් පරමාදර්ශයන් තිබූ අතර ප්‍රබල වටිනාකම් සඳහා සහාය දක්වනු ලැබීය. එම වටිනාකම්, ආගමික වටිනාකම්, සාමකාමී කතාබහ, හේතුසහගත වාද විවාද අන් අයට ගරු කිරීම සහ ස්වයං අධිෂ්ඨානය කෙරෙහි විශ්වාස කිරීම යන කාරණා මත කේන්ද්‍රගතව පැවතුණි. අතීතයේ සිටි නායකයන්ට වෙනස් දේශපාලන අදහස් තිබූ අතර, ඔවුන් සියලුදෙනාම එක හා සමානව සිතන ලද පුද්ගලයන් නොවූ අතර ගැටළු සඳහ වන ඔවුන්ගේ විසඳුම් විවිධාකාර ඒවා විය. එසේ වුවද ඔවුන් සියලුදෙනාම පොදු අරමුණක් සඳහා, එනම් මව්බිමේ නිදහස උදෙසා, ඒකට එක්ව කටයුතු කළහ.

අද අප රට පැමිණ සිටින්නේ ද එවැනි මංසන්ධියකට බව මම විශ්වාස කරමි. කතාබහ සහ විවාදය, ප්‍රචණ්ඩත්වයට සහ නින්දා අපහාස කිරීමට වඩා යහපත් බව අප විසින් වටහාගත යුතුව ඇත. අන් අය හා සමාන දැක්මක් අපට නොතිබුණ ද අනුන්ට ගරු කිරීමට අපට හැකිවිය යුතුය. යම් ප්‍රශ්න පිළිබඳව එකඟ නොවීමට සහ එකඟ විය හැකි දේශපාලනඥයන් අපට සිටිය යුතු අතර පක්ෂ දේශපාලන ඵලප්‍රයෝජනවලට වඩා ජාතික අවශ්‍යතාවයන් වැදගත් වන අවස්ථාවන්හිදී ඒ සඳහා එක්ව කටයුතු කිරීමට හැකි පරිණතභාවයක් සහ රාජ්‍යතාන්ත්‍රිකභාවයක් තිබිය යුතුය.

ගැටුම් අවසන්වී ඇති මෙම අවධියේදී එක් බලයක් විසින් අනෙක් බලය පාලනය කරනු නොලැබීම තහවුරු කරනු ලබමින් සමාජය ඉදිරියට ගෙනයාම සඳහා අපගේ දේශපාලන පද්ධතිය, නීති පද්ධතිය, සිවිල් සමාජය සහ මාධ්‍ය විසින් ඔවුන්ගේ අදාළ භූමි අපගේ ප්‍රජාතන්ත්‍රවාදය තුළදී අපට අවශ්‍ය වන නිර්මාණශීලී සමතුලිතතාවය වනුයේ එයයි.

මිනිසුන්ට ඔවුන්ගේ අදහස් අනුව ඉදිරියට ගමන් කළ හැකි සහ වෙනත් අය එකඟ නොවූවද ඒ පිළිබඳව නිදහසේ කථා කළ හැකි සහ අපගේ ජාතික අවශ්‍යතාවන් ආරක්ෂා කරගනිමින් සහ අපගේ අනන්‍යතාව පවත්වා ගනිමින් වෙළඳ සහ ආයෝජන හවුල්කරුවන් තුළින් ලෝකය සමඟ සම්පූර්ණයෙන්ම ගනුදෙනු කරනු ලබන සුරක්ෂිත හා විශ්වසනීය ජාතියක් සහ ඊර්ෂ්‍යාවෙන් තොර සමාජයක් ගොඩනැංවීම අපගේ අපේක්ෂාව විය යුතුය. කෙටියෙන් පවසන්නේ නම්, අපගේ ද්වේශසහගත සමාජය සාමකාමී සහ අන්

අයගේ අදහස් ඉවසන කාරුණික සමාජයක් බවට පරිවර්තනය කළයුතුය. එම සමාජයේ සියලුම ජනකොටස් එකිනෙකාට ගරු කරනු ලබන අතර, ප්‍රචණ්ඩත්වය සහ වෛරය ඉන් ඈත්ව ගිය දේවල් බවට පත්විය යුතුය.

ධම්ම පදයේ ඇතුලත් අදහසක් මෙහිලා උපුටා දක්වමි. " කිසිම තැනැත්තකුට දැඩි ලෙස කථා නොකරන්න. එසේ කථා කරනු ලබන තැනැත්තන් ඔබට දෙන පිළිතුරු ද එපරිදිම වේ. කෝපයෙන් යුත් කථාව වේදනාකාරීය. පහරට පහරදීමෙන් ඔබ බලපෑමට යටත් වන්නේය."

අප බුදුන් වහන්සේගේ හෝ හින්දු ආගම, ඉස්ලාම් ආගම හා ක්‍රිස්තියානි ආගම වැනි, අපගේ අනෙකුත් අග්‍ර ගණයේ ආගම්වල සඳහන් ඉගැන්වීම් පිළිපදින්නේ නම්, වඩාත් සානුකම්පික, සාමකාමී හා සෞභාග්‍යමත් ජාතියක් නිර්මාණය කිරීමට සාමූහිකව සහාය වීමට අපට පිළිවන.

අපගේ උත්කෘෂ්ඨ ජාතියේ සමස්ත විභව ශක්තීන් සාක්ෂාත් කරගැනීමට හැකිවන බවට මා විශ්වාස කරන චර්යාත්මක හා සමාජ වටිනාකම් අප සියලු දෙනාම විසින් හුවා දැක්වීමත් වැඩි දියුණු කිරීමත් සිදු කළයුතුය. එනම් :-

දේශපාලන පක්ෂ විසින් ගර්හාව, ප්‍රචණ්ඩත්වය හා පළිගැනීම ප්‍රකාශ කෙරෙන ආක්‍රමණශීලී ප්‍රතිවාදීත්වය දරා සිටීම ප්‍රතික්ෂේප කරන, ඒ වෙනුවට අනුකම්පාව හා ගෞරවය හා කීර්තියට නිතැතින්ම හේතු කාරක වන ප්‍රවේශයන් වූ සානුකම්පිත බව ගෞරවය හා හොඳ හිත අනුගමනය කිරීමට තෝරාගත් ජාතියක්

විවිධ සංස්කෘතික සම්ප්‍රදායන්ගෙන් සමන්විත වන, සිය සම්ප්‍රදායන් පිළිපැදීම හා සංවර්ධනය තුළින් සමස්ත ජාතියක් වශයෙන්, පොහොසත් සහ ශක්තිමත් වන අතර, පුරුෂයාට නොදෙවෙනි වන ස්ත්‍රිය සිය සමස්ත දායකත්වය ලබාදීමට කටයුතු කොට ඔවුන්ගේ සමස්ත විභව ශක්තීන් සාක්ෂාත් කරගැනීමට කටයුතු කරන ජාතියක්

කිසියම් හේතුවක් නිසා ස්වකීය ප්‍රයත්නයන් සාර්ථක කරගත නොහැකි තැනැත්තන්ට සහාය ලබාදීම පිණිස විධිවිධාන සලස්වන අතර, අපගේ උපායශීලී තැනැත්තන් විසින් නැවත වරක් ස්ථාවර ආර්ථික වර්ධනයක් ඇතිවන බවට සහතිකවීමට හැකිවන වෙළඳ පොළ කෙරෙහි නැඹුරුවූ ආර්ථිකයක්,

ආයෝජනය දිරිමත් කරන අතර වෙළඳ හවුල්කරුවන් සංඛ්‍යාව පුලුල් කෙරෙන ලෝකයට විවෘතවූ විශ්වාසවන්ත ජාතියක්

ස්වකීය ඉපැරණි සම්ප්‍රදායයන්ගෙන් ද, එමෙන්ම පුළුල් ලෝකය තුළින් වටිනාකමින් යුත් දේවල් උකහා ගන්නා අතරම, සුදුසු ලෙස සකස් කිරීමට සහ අළුතෙන් නිපැයීමට ඇති නෛසර්ග හැකියාවන් ගෙන් ද තම ශක්තිය ලබාගන්නා ජාතියක්

මෙම තත්ත්වය සාක්ෂාත් කරගැනීම සඳහා අප හැම කෙනකුටම පැවරී ඇති කාර්යභාරය අප විසින් ඉටු කළයුතුය.

අද අප ජීවත්වන්නේ බලය පවරනු ලබන යුගයක් තුළය. අප කැමති වුවද අකැමැති වුවද සන්නිවේදනය විසින් අපව ලෝකය වෙත විවර කොට ඇත. විදෙස්ගත ශ්‍රී ලාංකිකයෝ එක්සත් ජනපදය, කැනඩාව, එක්සත් රාජධානිය, ස්කැන්ඩිනේවියාව, ජර්මනිය, ඉතාලිය, ඕස්ට්‍රේලියාව සහ විශේෂයෙන්ම මැද පෙරදිග ආදි බොහෝ රටවල්පුරා විහිදී ජීවත් වෙති. ලෝකය සමග කරන අන්‍යෝන්‍ය සබඳතාවලින් අත්මිදීමට අපට නොහැක.

ඒ හා සමානව විදුලි සන්දේශ සේවාව සහ අන්තර්ජාලය විසින් අප එකිනෙකා වෙතටත් වෙළඳාමටත් විවාදයටත් මෙන්ම තොරතුරුවලටත් වඩාත් සමීප ලෙස සම්බන්ධ කර ඇත. තරුණ හා මහළු තැනැත්තන් ස්කයිප් මෘදුකාංගය සහ වෙනත් අන්තර්ජාල ශිල්පීය ක්‍රම භාවිතා කිරීමට දක්ෂ වී සිටින අතර, අපගේ තරුණ තරුණියෝ වෙබ් පිටු හා පණිවිඩ කියවමින් හෝ ලියමින් හෝ ෆේස්බුක් වැනි සමාජ ජාලයන්හි ඇති ඔවුන්ගේ පිටු පරීක්ෂා කරමින් අන්තර්ජාලය හා සම්බන්ධ වී ඔවුන්ගේ කාලය ගත කරති.

මෙම වෙනස්කම් අපගේ මාධ්‍ය කෙරෙහි ද ප්‍රබල බලපෑමක් සිදුකර ඇත. ප්‍රවෘත්ති යනු වර්තමානයේදී සතිය පුරාම සහ දවසේ 24 පැයේම ක්‍රියාත්මක වන දෙයක් වන අතර මේ වේලාවෙහිද අන්තර් ක්‍රියාකාරී වේ. අන්තර්ජාලය, ලිඛිත මාධ්‍යයන්ට සහ රූපවාහිනියට පවා වර්තමානයේදී තර්ජන එල්ල කරන අතර, මාධ්‍යයන්හි සහ පුවත්පත් කලාවේ පිළිගත් රීතීන් උඩුයටිකුරු කරමින් සිටී. ජාලගත/ මාර්ගගත ප්‍රවෘත්ති අඩවි වල ක්ෂණිකභාවය පුවත්පත් විශාල සංඛ්‍යාවක් වැසුණු කඩ බවට පත්කිරීමට හේතු වී ඇත. පුරවැසි පුවත්පත් කලාව සහ වෙබ් අඩවි, රූපවාහිණියෙන් විකාශණය කරන ප්‍රවෘත්ති සහ මාර්ගගත පුවත්පත් සමඟ වර්තමානයේදී තරඟ කරයි. ට්විටර් (Twitter) වැනි තාක්ෂණයකට සාම්ප්‍රදායික මාධ්‍යයන්ට වඩා වැඩි වේගයෙන් පුවතක් ලබාගත හැකිවූයේත්, දේශපාලන අධිකාරීන් මඟහැර කටයුතු කිරීමටත් පවා හැකිවූයේත් කෙසේද යන්න ඉරාකයේ මෑතදී හටගත් දේශපාලන අර්බුද පෙන්වා දුනි. ශ්‍රී ලංකාවේ ද ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් නොව සිංහල සහ දෙමළ භාෂාවලින් ද අන්තර්ජාල තාක්ෂණය ජනප්‍රියවෙමින් පවතී. මගේ කතාවේ මීට කලින් මා සැකෙවින් දක්වා ඇති අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මෙම ශිල්පීය ක්‍රම නිර්මාණාත්මක ආකාරයකින් භාවිතා කිරීමට අප ඒවා නිසි පරිදි සකස් කරගත යුතුය.

එවැනි උපකරණ තිබෙන නමුත් අපට අවශ්‍ය වන්නේ තොරතුරු දන්නා සමාජයකි. යම් ජාතියක ජීවය රැඳී ඇත්තේ එහි ඉතිහාසය තුළවන අතර, මෙම සාමූහික මතකය ජාතික අනන්‍යතාවයක් සහ ආරක්ෂිත සමාජයක පදනම ගොඩනංවයි. උදාහරණයක් ලෙස සෑම ඉන්දියානුවෙකුම යටත්විජිත පාලනයෙන් නිදහස ලබාගැනීම සඳහා වූ ඔවුන්ගේ සටන පිළිබඳවත්, නිදහස සඳහා සටන්කළ තැනැත්තන් පිළිබඳවත්, මහත්මා ගාන්ධි නේරු සහ බී.ආර්.අම්බෙඩ්කාර් වැනි ඔවුන්ගේ ව්‍යවස්ථාව සකස්කළ තැනැත්තන් පිළිබඳවත් හොඳින් දනී. ඇමෙරිකා එක්සත් ජනපදයේ පාසැල් යන වයසේ ඕනෑම ළමයකුට ඇමරිකානු ව්‍යවස්ථාවේ දාර්ශනික මූලධර්මයන් සහ ඔවුන්ගේ දේශපාලන ක්‍රමයේ මූලාරම්භය වටා ඇති විවාදයන් ඉතා පුරුදු දෙයකි. එක්සත් රාජධානියේ පාසැල් ළමයින්ට මැග්නාකාර්ටා ගිවිසුම, ජෝන් රජු, ක්‍රොම්වෙල් සහ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව උගන්වනු ලැබේ.

අපගේ ඉතිහාසය, අවබෝධ කර ගැනීමේ වැදගත්කම සහ අද අප සිටින තැනට අපව ගෙන ගොස් ඇති මූලික අත්දැකීම් අප විසින් අමතක කර දමා ඇති අයුරු ශ්‍රී ලංකාවේ දී අපට පෙනී යයි. දශක තුනක කාලයක පටන් සාමය හා එයින්ම සමාජයට ගැටළුවක් වන කාරණා වලින් අපව අන්ධභාවයට පත් කිරීමට අපගේ කෝපයට අප ඉඩදී ඇත. පහසු කිරීම උදෙසා අපගේ නීතිඥ ප්‍රජාව තුළ කටයුතු කරන විවිධ මත දරන්නන් වශයෙන් තාක්ෂණය සහ සන්නිවේදනය උපයෝගී කර ගනිමින් මෙම වෙනස සිදු කිරීම පහසු කිරීම සඳහා ඔබ සිටින්නේ ඉතා සුදුසු ස්ථානයකය. එම නිසා කිසියම් වෙනසක් කිරීම සඳහා මෙය අවස්ථාවක් කරගන්නා ලෙස මා ඔබගෙන් ඉල්ලා සිටිමි. වෙනස සිදුකිරීමේ උත්ප්‍රේරකයා වීමට ඔබට පුළුවන. විවිධ රටවල වෙසෙන ශ්‍රී ලාංකිකයන් අප සියලුදෙනාම එම චෝදනාව භාරගතයුතුය. ගෙවීගිය වසර ගණනාව පුරාවට අප සමාජය වෛරයේ ගිනිදැල්වලින් මුදවා ගැනීමට සහ ජාතිය, ආගම, කුලය, පංතිය සහ දේශපාලනික වශයෙන් බෙදීමට ලක්වීම නතර කිරීමට අප අපොහොසත් වී ඇත. අපගේම නොසලකා හැරීම නිසා මෙම වෛරය වැඩිදියුණුවීමට අප විසින් ඉඩ ලබාදෙන ලදී. දේශපාලනයේදී සහ පාලනයේදී ප්‍රතිපත්ති අභිබවා උපයෝගයද සාධාරණත්වය අභිබවා තමන්ගේ වාසියට ක්‍රියාකිරීම ද , හරවත් ප්‍රකාශයන් අභිබවා ජනප්‍රිය කතාවන්වද පරමාදර්ශවාදය අභිබවා සම්මතය අභියෝගයට ලක්කිරීම ද අප විසින් තෝරා ගෙන ඇත.

සෑම පැරණි සංකල්පයක්ම සහ නව අදහසක්ම ගැන ප්‍රශ්න කරන ලෙස අපි ඔබගෙන් ඉල්ලා සිටිමු. දැඩි නොවන්න. යම් ප්‍රශ්නයකට එක් පැතිකඩ එකකට වැඩි සංඛ්‍යාවක් ඇති නිසා අනෙක් අයගේ අදහස් සලකා බැලීමට කාලය යොදවන්න. අනෙක් අයට ගරු කරන්න. ප්‍රජාතන්ත්‍රවාදය තුළ සෑම කෙනෙකුටම තමාගේ අදහස් ප්‍රකාශ කිරීමට අයිතියක් ඇති නිසා ඔහු හෝ ඇය කෙතරම් නිහතමානී වුවද ඔවුන්ට ගරු කරන්න. නමුත් නිවැරදි මාවත හමුවනතුරු සෑම දෙයකටම අභියෝග කරන්න. වැඩදායක ලෙස ප්‍රශ්න කරන්න.

ඔබත් මමත් යන දෙදෙනාම සේවය කරන්නේ ජනතාවට නිසා ඔවුන්ට සත්‍යවාදී වන්න. සෑම පුද්ගලයකුම ඔබගේ ප්‍රයත්නයෙන් සියයට සියයක් ලැබිය යුතු බව සිතේ තබාගන්න. අපගේ සමාජය වෙනස් කිරීම සම්බන්ධයෙන් බලාපොරොත්තු තැබිය හැක්කේ ඔබ මගින්

නිසා නායකත්වය දෙන්න. නීතිඥයන් ලෙස ඔබ අප සමාජයේ වරප්‍රසාදලත් සහ බලපෑම් කළ හැකි තත්ත්වයක සිටින නිසා ජනතාව ඔබට ගෞරව කරනු ඇත. එමනිසා ඔබ එක් කණ්ඩායමක් ලෙස විශාල වගකීමක් උසුලන අතර, වෙනසක් ඇති කිරීම සඳහා විශාල දායකත්වයක් ලබාදීමට ඔබට හැකිවේ.

රටක් වශයෙන් අපි අපගේ මාර්ගයේ සන්ධිස්ථානයකට පැමිණ සිටිමු. මීළඟට අපට අවශ්‍ය වන්නේ කුමන මාර්ගයේ යාමද යන්න අප විසින් ප්‍රවේශමෙන් සිතා බැලිය යුතුය. ඔබ මෙම කාරණය ගැන මෙනෙහි කරන අතර, Robert Frost නම්වූ ඉංග්‍රීසි කවියා විසින් ලියන ලද පද්‍යයක පද කීපයක් ඔබ වෙත ඉදිරිපත් කරමි.

ඝන වනාන්තරයක් තුළ මාර්ගයක් දෙපසට බෙදී ගොස් ඇත. එක් කෙනෙකුවන මට එම මාර්ග දෙකෙහිම ගමන් කිරීමට නොහැකිය. එක් මාර්ගයක් වනවදුලේ නොපෙන් ගියේ කොතැනකටදැයි මම දිගු වේලාවක් තිස්සේ නෙත් අයා බලා සිටියෙමි.

දීර්ඝ කාලාන්තරයකට පසුව සුසුම් හෙලමින් මා විසින් මෙසේ පවසනු ඇතැයි සිතිය හැකිය : වනාන්තරයක් තුළ මාර්ග දෙකක් දෙපසට විහිදී ගොස් ඇත. මගීන් අඩුවෙන්ම ගමන් කර ඇති මාර්ගය මම තෝරා ගනිමි. සියළුම වෙනස්කම් වලට හේතුව එයයි.

ස්තූතියි.

මිලින්ද මොරගොඩ